**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**SINHALA**

**සිංහල**

# QUESTION PAPER - III (ANSWERS)

# ප්‍රශ්න පත්‍රය - III (පිළිතුරු)



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - III**

**අ.පො.ස. (සා / පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

අපේක්ෂණය : නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය
ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20 ( එක් කොටසකට ලකුණු 04 බැගින් )

(අ) කොටසට ලකුණු 02යි.
(ආ) කොටසට ලකුණු 02යි.

1.

I. (අ) කීර්තිය
(ආ) රූපකාලංකාරය

II. (අ) අඟුල්මල් දමනය
(ආ) කතාවෙන දේ

III. (අ) මහාවංශය
(ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්

IV. (අ) මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගහටත් හෙණ නොවදිද්ද
(ආ) අනිත්‍යතාවය

V. (අ) අපට වැසිකිළියක්
(ආ) තුරල් වී

VI. (අ) හංස සංදේශය
(ආ) පළින් පළම - තැනින් තැන
තළින් තළම - පොකුණක් පොකුණක් පාසා

VII. (අ) උග්ගසේන සිටු පුත්‍රයා
(ආ) පාලි දම්මපදට්ඨ කථාව ( පාලි යන්න ලියා නොතිබුණ ද ලකුණු දෙන්න. )

VIII. (අ) සත් රුවනින් නව නිදහන් මතු වී
(ආ) විශේෂණ පද නිම විශේෂණ

XI. (අ) නිදහසේ දැහැන / නිදහසේ මන්ත්‍රය
ලංකාමාතා
(ආ) කව්මිණ / කව් මුතු / ළමා කව් කළඹ

X. (අ) කේවට්ට බමුණාගේ / කේවට්ටාචාරීන්
(ආ) කුරුණෑගල සාහිත්‍ය යුගය

2. එක් කොටසකට ලකුණු 04 බැගින් සම්පූර්ණ ලකුණු 20කි.

I. (අ) සංසාරික ජීවිතය / සසර ගමන
(ආ) එළිසමය / එළිවැට

II. (අ) විද්දත් දියණිය වෙනුවෙන්
(ආ) නැටුම් කුලයෙහි උපන් දියණියගේ හැඟීම් විලාසයන් සැර සුළං සහිත අහසෙහි අත් පා හැසිරවීම් ආදී අංගචලනත් විසිලුවක් ( විහිලුවක් ) තද ආකාරයෙන් නොසිතා ඇ කෙරෙහි තදින් ම ප්‍රේම ඇතිව

III. (ආ) කැරගල විහාරයට
(ආ) වටේට මල් පිපුණු විල්වල බිඟු මී මැසි රංචු නද දෙන බව (හාත්පස මල් පිපුණු විල්වල මීමැසි නාදය ඇසෙයි)..............................................................

IV. (ආ) මැටිල්ඩාට
(ආ) පරාර්ථකාමී බව / යහපත් ස්වාමිපුරුෂයෙක් බව

V. (ආ) ඔය ජලයෙන් පිරී ඇති බව
කවියා 'දොඩමලූය' යන යෙදුම හරහා ඔය සප්‍රාණිකරණය කරයි.

(ආ) ඔයට
සොඳුර සුදු මල් පොකුර
(උපමේය) ( උපමාව )

03. ලකුණු 15 ක ප්‍රශ්නයකි.

I. මහෞෂධ පණ්ඩිතයන්ගේ ස්ථානෝචිත ප්‍රඥාව
"මා බඳු පණ්ඩිතයන් පණ්ඩිතයෙක් ජීවත් ව හිඳිද් දී ම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේ ය."

| | |
|---|---|
| සතර කන් මන්ත්‍රණය | "යමු ගුරු මා බා ලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තූ තූ කොට පියා.." |
| | "ගිරා පෝතකයන් මන්ත්‍රණය අසා නිමව.." |
| යුද්ධෝපාය යෙදීම | "අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේ වූ දොලක් විය. කෙසේ ද යත් දස දහසක් යොදුන් දඹදිව රජු මළුල්ල සේනාව පිරිවරා අවුත් මා දැන් මා උන් නුවර පිරිවරා සිටි කල සැණකෙළි කෙළිමි' යි" |
| ධර්ම යුද්ධය | "කේවට්ටයෝ පණ්ඩිතයන් වහන්සේ අත දිලිසෙන මිණි රුවන දැක මේ පණ්ඩිතයන් වහන්සේ මට රුවනක් ගෙනා වන්නාහ යි සිතා එසේ වී නම් දෙව…" |

II. කේවට්ට බමුණාගේ ආත්මාර්ථකාමී බව

"මෙබඳු සම්පත් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අග රජ කළොත් යහපත"
"රා මණ්ඩලයක් සාදා උන් හැම දෙනා රා බොන්නට යැ යි රා මැඩිල්ලේ හිඳුවාලා වීර යොදා කරන ලද්දා වූ …"
"යහපත් නැකතකින් නික්මුණ මැනව"
"මේ පණ්ඩිතයන් වහන්සේ මට රුවනක් ගෙන වන්නාහ යි සිත.......... එසේ වී නම් දෙව .."

නැතහොත්

I. ජන කවියේ ඇති අව්‍යාජත්වය

"මා කී දේ දෙයියනි බොරුවක් ම නැති"

"එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්
මග යන්නෝ මට සරදම් කරක්කන් "

II. කුරහන් ගොවියා මුහුණ දෙන අභියෝග

"නිල්ල අඹති සත් දවසින් බැලුවාම"
"වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්"
"අපොයි මගේ කිරි වදිනා කුරක්කන්"
"ඌරෝ නොකා පලයව් මගෙ කුරක්කන්"
"එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්"

04.

I. සත්ව චර්යා

- පිය සන් නොම බිඟු දැල් රැඳි කොපුලී
  අවසන් නො ම වෙණ නදටම කුහුලී
  මදසන් සුන් පියොවින් සිටි නොසැලී
  ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී
  (සත්ත්ව චර්යාවන් දෙකක් එදින වෙනස් වූ බව)

- "අසන රිසින් නයි කැල ඔසොළෝය"

- "බැඳි දන මන වැයුමෙහි ඇදුරෝය"

(වන්දිභට්ටයන්ගේ ස්වරූප ගත් කිඳුරු කණ්ඩායම් එදා තම සුපුරුදු චර්යාවෙන් මිදුණු බව)

II. මානව චර්යා

- "නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා"
- අති' නවී ගිලිහෙන බව නොම දත්තෝ

නැතහොත්

I. අවස්ථා නිරූපණය

"ලදොත් ජීවත් වෙමි නොලදොත් මියෙමි සිතා ගෙන නො කා නො බී හැඳට නැගී ලා වැද හොත්තා හ"

"මේ හැම මා අරභයා කිය වූ ද"

"……රැස් වූවන් කොස්සන් ගසන නියාවෙන් ඇඟිලි පා හිඟි කොට ලා හුණු දඬු අග සිට ලා නික්ම සිස් අහස ම සත් විටක් පෙත්තක් මෙන් සිසැරී බලා…"

II. චරිත නිරූපණය

"ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි."

"…..හුණ දඬු අගින් අහසට නැගී ලා තුදුස් මිටක් විතර අහස සිසැරී පියා බැස ලා හුණ දඬු අග සිටියහ."

"ස්වාමිණි උග්ගසේන තෙරහු හුණු දණ්ඩෙන් බස්නා ගමනේ තමන්ට බයක් නැති යි කියති. ඒ ලෙස කියා තමන් රහත් නියාවක් සඟවති."

මෙසේ උග්ගසේන තරුණයා ජීවිත අභියෝගය ජයගත්තේ ය.

05.

♦ දෘෂ්ටිගෝචර භාෂාවක් යොදා ගැනීම

"පුංචි මැණිකා දවසින් වැඩි කාලයක් ගත කළේ මේ බියකරු සිතිවිලිවල පැටලී ගෙපිලේ හිඳ නිකටට අත තබා ගත් ගමන් ය."

♦ උපමා මිශ්‍ර භාෂාවක් යොදා ගැනීම

"කුඹුක් වැනි ගස්වල පිට පොත්ත තැනින් තැන ඉගිලී සුදු ම යන්නාක් මෙන් ඇගේ සමේ ද තැනින් තැන දුඹුරුවන් සුදු පුල්ලි නැගී තිබිණි."

"ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇළලී, ඇකිළී යන විට ...."

♦ සංවාදශීලී බස් වහරක් යොදා ගැනීම

"සීයේ අර ජේන්නේ හිර ගෙදර" ද

"ඇයි?"

♦ ගැමි වහර භාවිතය

"ඒ වෙළඳපල අරණු දවසකි."

"ඒත් තමන්ගේ පැල්පතයි. මිදුලයි කැලෙයි..."

"බාග වෙලාවට අසනීප වෙන්නත් පුළුවනි "

06. කාව්‍යොපක්‍රම

♦ සංකේත

මඳ සුළඟ (බෞද්ධාගමික පරිසරය හරහා ඇතිවන ආධ්‍යාත්මික සංහිඳියාව)

♦ රූපක

"නිදහස මහ මුහුදක් වේ"

"ජාතිය රන් විමනක් වේ"

"ආගම මිණි පහනක් වේ"

♦ ව්‍යංග්‍යාර්ථය

"එහි උල්පත පුත නුඹ වේ"

"යුතුකම ඉටු කළ යුතු වේ"

♦ අනුප්‍රාස පද

" ජාතික රණ දෙරණ මතේ "

" ගැටී ගැටී වැටී මළ මොහොතේ "

07. " පෙරදිග මහාර්ඝ තිරරෙදිවලින් අලංකාර කරන ලද උස් ලෝකඩ පහන් රුක්වලින් …….. සරුවාල ඇඳ ගත් දැවැන්ත සේවකයන් දෙදෙනෙකු විසින් ආවතේව කරනු ලබන නිහඬ නිශ්ශබ්ද අන්තර් ගර්භාගාර ඇ සිතින් මවා ගත්තා ය. "

" ඇයට ඇඳුම් පැලඳුම් හෝ මුතු මැණික් හෝ කිසිවක් නො තිබුණේ ය."

" එහෙත් ඇය ආශා කළේ ද ඒවාට ම ය. "

" එ හෙයින් ඇ තමන් මිතුරිය බැලීමට නොයෑමට සිතා ගත්තා ය. "

" ෆෙරෙස්ටියර් නෝනාගේ මාලෙ - මාලෙ නැතිවෙලා "

" ඇ තෙල් සහිත හැළි වළන් ද වෙනත් මැටි බඳුන් ද පිගන් කෝප්ප හා දීසි පිරිසි ද තම රෝස පැහැති නිය ගෙවී යන තුරු සේදුවා ය. "

"දිළිඳු දුප්පත් ගැහැණියක මෙන් ඇඳුම් පැළඳුම් කළ ඇ අතේ එල්ලා ගත් මල්ල ඇතිව… "

ආදී වශයෙන් මැටිල්ඩා සිහින ලෝකයක ජීවත් වූ අයුරු පෙන්වා දී ඒ නිසාම ඇය බොහෝ ව්‍යසනයන්ට ලක්වීම පැහැදිලි කිරීම.